(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **23.**]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2022 අප්‍රේල් 07 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

අතිගරු **ගෝඨාභය රාජපක්ෂ මහතා**, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු දිලුම් අමුණුගම මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම: (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දහවැනි කාණ්ඩයේ සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සම්බන්ධ විශේෂ විගණන වාර්තාවේ - II කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2016, 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද නියෝග කරන ලදී.

2. කාරක සභා වාර්තා පිළිගැන්වීම: රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම සභාව වෙත යොමු කරන ලද—

(i) අධිභාර බද්ද පනත් කෙටුම්පත;

(ii) (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ නිවේදන; සහ

(iii) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියම

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

3. මහජන පෙත්සම් පිළිගැන්වීම:

(1) පිළියන්දල, බෝකුන්දර, කුරුඳුවත්ත පාර, අංක 273/2සී දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ.ජී. නීලකාන්ති මහත්මියගෙන් ලැබුණු 2021.11.10 දිනැති පෙත්සම ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) පිළියන්දල, පී.එස්. පෙරේරා මාවත, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි ජනක් ලියනගේ මහතාගෙන් ලැබුණු 2021.11.01 දිනැති පෙත්සම ගරු නිමල් ලාන්සා මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

4. අධිභාර බද්ද පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වන වගන්තිය සභා සම්මත විය.

2 වන වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වන පිටුවේ 21 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා වන පේළිය (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(ආ) 2020 අප්‍රේල් මස පළමු වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගමේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන බදු අයකළ හැකි ආදායමේ එකතුව රුපියල් මිලියන දෙදහස ඉක්මවන්නේ නම්, එම සමාගම් සමූහයේ එක් සමාගමක බදු අයකළ හැකි ආදායම් රුපියල් මිලියන දෙදහස නොඉක්මවවුව ද, එය නොතකා, එම තක්සේරු වර්ෂය සඳහා, එම එක් එක් සමාගමක බදු අයකළ හැකි ආදායමේ කොටසක් වන්නා වූ පාලිත සමාගමෙන් ලද ලාභාංශවලින් ලැබීම් සහ ලාභ අඩු කිරීමෙන් පසුව එම එක් එක් සමාගමේ බදු අයකළ හැකි ආදායම මත සීයයට විසිපහක අනු ප්‍රමාණයෙන් අයකරනු ලැබිය යුතු ය:
>
> එසේ වුව ද, සමාගමක්, (ආ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව බද්ද ගෙවීමට යටත් වන්නේ නම්, එකී සමාගම (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව බද්ද ගෙවීම සඳහා යටත් නොවිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වන පිටුවේ 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා වන පේළිය (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වන පිටුවේ 8 වන සහ 9 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ආදායමේ එකතුව ගණනය කිරීමේ දී, පාඩු හෝ හිලව් නොකළ පාඩු හේතුවෙන් බදු අයකළ හැකි ආදායම ශුන්‍ය වටිනාකමක් සහිත එම සමාගම් සමූහයේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වන පිටුවේ 22 වන සහ 23 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ජනරාල්වරයා වෙත 2022 අප්‍රේල් මස විසි වන දිනයේ දී සහ 2022 ජූලි මස විසි වන දිනයේ දී හෝ ඒ දිනවලට පෙරාතුව'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වන පිටුවේ 28 වන පේළියේ සිට 30 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වන පිටුවේ 24 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ප්‍රකාශයට අනුව ඒ සමාගමේ ආදායම් බදු ගෙවීමට පෙර පැවති'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වන වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වන පිටුවේ 5 වන සහ 6 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''එසේ නියමිත තොරතුරු ඇතුළත් බදු වාර්තාවක් 2022 අප්‍රේල් මස 20 වන දින හෝ එදිනට පෙරාතුව කොමසාරිස්-ජනරාල්වරයා වෙත'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වන පිටුවේ 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වන වගන්තිය සභා සම්මත විය.

5 වන වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වන පිටුවේ 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''තක්සේරුවක් සකස් නොකළ යුතු ය:

එසේ වුව ද, විරෝධතාවයක හෝ අභියාචනයක තීරණයක් මත පදනම්ව සංශෝධිත තක්සේරුවක් කිරීම සඳහා ඉහත කාලසීමාව අදාළ නොවිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වන වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වන පිටුවේ 21 වන සහ 22 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> '' ''සමාගම'' යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු නමුත්-
>
> (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේවකය අර්ථසාධක අරමුදල;
>
> (ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල;
>
> (ඇ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 12 වන වගන්තියේ (ඒ) ඡේදය යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සහ ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල;
>
> (ඈ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 90 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල;
>
> (ඉ) (289 අධිකාරය වූ) වෙළඳ සංගම් ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වෙළඳ සේවා අර්ථසාධක සමිතිය;
>
> (ඊ) (397 අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව මඟින් පිහිට වූ ලංකා බැංකු අර්ථසාධක අරමුදල;
>
> (උ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුව පොදු සමාගම යටතේ පිහිටුවන ලද හැටන් නැෂනල් බැංකු සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල;
>
> (ඌ) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ පිහිටුවන ලද මහජන බැංකු විශ්‍රාම භාර අරමුදල;
>
> (එ) (422 අධිකාරය වූ) මුදල් නීති පනතේ 10 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකු සේවා නියුක්තයන්ගේ විශ්‍රාම අරමුදල;
>
> (ඒ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ටෙලිකොම් අර්ථසාධක අරමුදල;
>
> (ඔ) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල;

(ඕ) (87 වන අධිකාරය වූ) භාර අඥාපනත යටතේ පිහිටුවන ලද (1996 පසු) 2014 ලංකා බැංකු විශ්‍රාම භාර අරමුදල;

(ක) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ IV වන කොටසේ විධිවිධාන ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක් හෝ දායක විශ්‍රාම යෝජනා ක්‍රමයක්,

ඇතුළු යම් සේවක භාර අරමුදලක්, අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම අරමුදලක්, විශ්‍රාම භාර අරමුදලක්, පාරිතෝෂික හෝ සේවය අවසන් කිරීමේ අරමුදලක් ඇතුළත් නොවේ;''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ලද පාලක සමාගමක් හැර, 2021 මාර්තු මස තිස් එක් වන දිනය වන විට වෙනත් සමාගමක ඡන්දය'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වන පිටුවේ 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''නොකරන ලද පාලිත සමාගමක් හැර, 2021 මාර්තු මස තිස් එක් වන දිනය වන විට ස්වකීය''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වන වගන්තිය සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වනවර කියවිය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වනවර කියවා සම්මත කරන ලදී.

5. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය (අංක 1): මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස

අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය (අංක 2): මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 11 දිනැති අංක 2262/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. අධිකරණයට අපහාස කිරීමේ පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

(පූ.භා. 11.39 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.17 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.15 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

8. කල් තැබීම "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 3.55 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2022 අප්‍රේල් 08 සිකුරාදා පූ.භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.